## සමූපකාර ප්‍රතිපත්ති

### 1. විවෘත හා ස්වේච්ඡා සාමාජිකත්වය

මෙම සමිතියේ වගකීම් දැරීමට කැමති ඕනෑම අයෙකුට කිසිදු සමාජ ,ජාති ,ආගම් ,දේශපාලන හා ලිංග භේදයකින් තොරව, බාධාවකින් තොරව සාමාජිකත්වය ගැනීමට හැකියාව ඇත.

### 2. ප්‍රජාතාන්ත්‍රික සාමාජික පාලනය

මෙම සමිතිය ප්‍රජාතන්ත්‍රීය සංවිධානයකි.මෙය පාලනය කරනු ලබන්නේ සාමාජිකයා විසිනි.සමාජිකයා වනාහි සමිතියේ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේදී ක්‍රියාශීලීව සහභාගී වන්නා වේ.නිලධාරීන් ලෙස වගකීමට තෝරා ගන්නා අය සාමාජිකත්වයට වගකිව යුතුය. සෑම සාමාජිකයෙකුටම මෙම සමිතියේදී සමාන අයිතිවාසිකමක් හිමිවේ. එක් අයෙකුට එක් ඡන්දයක් යන මූල ධර්මය ක්‍රියාත්මක වේ.

### 3. සාමාජික ආර්ථික සහභාගිත්වය

සමාජිකයින් ප්‍රාග්ධනයට දායක වෙති. එමෙන්ම ප්‍රාග්ධනය ප්‍රජාතන්ත්‍රව පාලනය කරයි.අඩුම වශයෙන් ප්‍රාග්ධනයෙන් කොටසක් මෙම සමිතියේ පොදු දේපලකි. සාමාජියෝ ස්වකීය ප්‍රග්ධනය සඳහා සීමිත ප්‍රතිලාභ ලබති. ස්වකීය සමිතියේ අතිරික්තය සමාජිකයින් විසින් සියල්ලම හෝ කොටසක් සංචිත ගොඩනැගීම තුලින් මෙම සමිතිය දියුණු කිරීමට සහ සමාජිකයින් විසින් අනුමත කරන ලද වෙනත් කටයුතු සඳහා යොදවනු ලැබේ.

### 4. ස්වෛරීත්වය හා ස්වාධීනත්වය

මෙම සමිතිය ස්වකීය ප්‍රාග්ධන සම්පාදනය සඳහා රජය හෝ වෙනත් පරිබාහිර ආයතන වෙත යොමුවේ නම් , එහිදී එළඹෙනු ලබන ගිවිසුම් සමිතියේ ස්වාධීනත්වය හා සමාජිකයාගේ ප්‍රජාතාන්ත්‍රික පාලනය තහවුරු වන බව සහතික කරගත යුතුය.

### 5. අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු

මෙම සමිතිය ස්වකීය සාමාජිකයන්ට, නියෝජිතයන්ට ,කළමනාකරුවන්ට සහ කාර්ය මණ්ඩලයට අධ්‍යාපනය හා පුහුණුව ලබාදේ.ඔවුන් පොදු ජනතාවටත් ,විශේෂයෙන් ළමා හා තරුණයන්ටත් , උපදේශාත්මක නායකයන්ටත් එක්ව කටයුතු කිරීමේ ස්වභාවයත් ප්‍රතිලාභත් පහදා දෙනු ලබයි.

### 6. සමුපකාර අතර සහයෝගීතාවය

මෙම සමිතිය ස්වකීය සාමාජිකත්වය ශක්තිමත් කිරීම සඳහා දැඩිව කටයුතු කරන අතර ප්‍රාදේශිය, ජාතික,කාලප හා ජාත්‍යන්තර සමුපකාර ව්‍යුහයන්ගේ සාමාජිකත්වය ලබමින් එක්ව කටයුතු කළ යුතුය.

### 7. ප්‍රජාව කෙරෙහි වූ අනුවේදීතාවය

මෙම සමිතිය ස්වකීය සාමාජිකයා විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්තීන් ඔස්සේ ස්වකීය ප්‍රජාවගේ තිරසාර සංවර්ධනය උදෙසා කටයුතු කරනු ලබයි.ස්වකීය සාමාජිකයා සමඟ දැඩි ස්වාධීනත්වයකින් කටයුතු කරයි.ප්‍රජාවගේ ආර්ථිකමය,සමාජමය හා සංස්කෘතිකමය තිරසාරත්වය පිළිබඳ අවධානය යොමු කිරීම සමිතියේ වගකීමකි.මෙම සමිතිය පාරිසරික ආරක්ෂණ කටයුතු කෙරෙහි මැදිහත් විය යුතුය.

## සමුපකාර සාරධර්ම

- ආත්මාධාරය
- ස්වයං වගකීම
- ප්‍රජාතාන්ත්‍රික බව
- සාමානාත්මතාවය
- සහයෝගීතාවය
- සාධාරණත්වය
- ස්වාධීනත්වය
- අවංකත්වය
- විවෘත බව
- සාමාජ වගකීම
- අන්‍යයන්ට ගරු කිරීම